අමාත්‍යාංශ චක්‍රලේඛ. 95/27

මගේ අංකය. 2/පිරි 2/108
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
" ඉසුරුපාය " බත්තරමුල්ල.
1995 ඔක්තෝබර් මස 03 වැනි දින.

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.

**අනුමත පිරිවෙන්වල හා උපකෘත පාසල්වල සේවයේ නියුතු ගුරු භවතුනට ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළ වැටුප් ක්‍රම හිමිකර දීම.**

---

ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවීම හේතුවෙන් රජයේ පාසල්වල නියුතු ගුරුවරුනට හිමි වී ඇති නව වැටුප් ක්‍රම පදනම් වූ වැටුප් වැඩිවීමේ වාසිය 1995.01.01 දින සිට අනුමත පිරිවෙන් හා උපකෘත පාසල්වල ( ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් හා ආබාධිතයන් සඳහා වූ ආධාර ලබන පාසල් )සේවයේ යෙදී සිටින යෝග්‍ය ගුරු මණ්ඩලවල රජය විසින් වැටුප් ගෙවනු ලබන ගුරුවරුන්ට ද හිමිකර දීමට රජය තීරණය කර ඇත.

02. එබැවින් ශ්‍රී ලංකා ගුරු සේවය ක්‍රියාත්මක වූ 1994.10.06 දින වන විට අනුමත පිරිවෙන්වල හා උපකෘත පාසල්වල යෝග්‍ය ගුරු මණ්ඩලවල සේවයේ යෙදී සිටි සියළුම ගුරුවරුන්ගේ වැටුප් 1995.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි දක්වා ඇති ආකාරයට පරිවර්තනය කර ගෙවිය යුතුය.

03. වැටුප් පරිවර්තනය කිරීමේදී නිර්ණායකයන් වනුයේ ගුරුවරයාගේ අධ්‍යාපන සුදුසුකම් හා ඔහු විසින් සම්පූර්ණ කර ඇති සේවා කාලයයි. එබැවින් ගුරුවරුන් වර්ගීකරණය කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන නිර්ණායකයන් වන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තරයක් ඔබගේ පහසුව සඳහා පහතින් සඳහන් කෙරේ.

1. උපාධිධාරී ගුරුවරුන්.

   අමාත්‍යාංශය විසින් අනුමත විෂය ධාරාවක් මත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද උපාධියක් හෝ අධ්‍යාපන සේවා මණ්ඩලය විසින් ඊට සමාන යයි පිළිගැනෙන සුදුසුකම් සහිත ගුරුවරුන් හෝ ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන සහතිකය, බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයේ ත්‍රිපිටකවේදී සහතිකය, බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ උපාධි සහතිකය දරණ ගුරුවරුන් ( මොවුන් උපාධි ගුරු පත්වීමක් දරත් නම් පමණක් උපාධි ගුරුවරුන් වශයෙන් සැළකේ.)

2. පුහුණු ගුරුවරුන්.

   අමාත්‍යාංශය අනුමත කළ ගුරුවරුන් පුහුණු කිරීමේ ආයතනයක දෙවසරකට නො අඩු ආයතනික පුහුණුවක් (පිරිවෙන් අභ්‍යාස ආයතන ද ඇතුලුව)

   හෝ

   අමාත්‍යාංශය අනුමත කළ දුරස්ථ ක්‍රමයක වසර තුනකට නො අඩු පුහුණුවක් ලද ගුරුවරු.

3. **ඩිප්ලෝමාධාරී ගුරුවරුන්.**

පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් නොවන්නාවූ ද, අමාත්‍යාංශය අනුමත ආයතනයක වසරකට නො අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් වූ පාඨ මාලාවක් සාර්ථක ලෙස අවසන් කළ ගුරුවරු.

4. **වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන්.**

ඉහත 2 හි සඳහන් ගුරු පුහුණුවක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ අධ්‍යාපනවේදී විශේෂ උපාධියක් සහිත හෝ උපාධිධාරී ගුරුවරුන් (අනිකුත් උපාධිධාරී ගුරුවරුන් වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරීන් වශයෙන් සැළකිය යුතුය.)

5. **නුපුහුණු ගුරුවරුන්.**

ඉහත වර්ග හතරටම අයත් නොවන අනෙකුත් සියලු ගුරුවරු.

04. **වැටුප් පරිවර්තනය කිරීමේ සටහනක් ඔබට මග පෙන්වීම සඳහා මේ සමග අමුණා ඇත.** (ඇමුණුම - 1)

කෙසේවතුදු වැටුප් පරිවර්තනය කරන අවස්ථාවේදී කිසියම් ගුරු භවතෙකු මෙහි සඳහන් ගුරු ශ්‍රේණියට අදාළ නොවන වෙනත් වැටුප් ක්‍රමයක් ලබන බව පෙනී ගියහොත් මගේ 95/07 හා 1995.03.08 දින දරණ චක්‍රලේඛයට අමුණා ඇති වගුව අනුසාරයෙන් විසඳුමක් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.

05. පිරිවෙන් හා උපකෘත පාසල්වලට ගුරුවරුන් බඳවා ගනු ලබන්නේ එම ආයතනයන්හි කළමනාකාරීත්වය ( පිරිවෙන් කෘත්‍යාධිකාරී, උපකෘත පාසලේ කළමනාකරු) විසින් බැවින් 1994.10.06 දිනෙන් පසු මෙම ආයතනවලට බඳවාගනු ලැබූ ගුරුවරුන්ගේ වැටුප ද නව වැටුප් ක්‍රම අනුව සංශෝධනය කර ගෙවිය යුතුය. මේ අනුව 1994.10.06 දින හෝ ඔවුන්ගේ මුල් පත්වීමේ දින හෝ යන දෙකින් පසුව එළඹෙන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ආකාරයට අදාළ වැටුප් ක්‍රමයන්හි පිහිටුවීමට කරුණාකර කටයුතු කරන්න. ඔවුනට නව වැටුප් ක්‍රමයන්හි වැටුප් ගෙවිය යුත්තේ 1995.01.01 වැනි දින හෝ ගුරුවරයාගේ මුල් පත්වීමේ දින යන දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වේ. ( පත්වීම ලද දින සිට මාස 12 ක් සපිරෙන දින දක්වා වූ කාලය පළමුවන වසර වශයෙන් ද එතැන් පටන් ඒ අනුසාරයෙන් දෙවන, තුන්වන, සිව්වන වසර ආදි වශයෙන් ගණන් ගත යුතුය) කිසියම් ගුරු භවතෙකු සිය සේවා කාලය තුල වැටුප් රහිත නිවාඩු ලබාගැනීමේ හේතුවෙන් හෝ විනයානුකූල හේතුවක් මත වාර්ෂික වැටුප් වර්ධක අහිමි කරනු ලැබූ සිටින් නම් නව වැටුප් පියවර තීරණය කිරීමේදී එම කාලය ගණන් ගත යුතු නොවේ. එවැනි අවස්ථාවක ඔහුගේ ඊළඟ වැටුප් පියවර ලබා දිය යුත්තේ ඔහුට එසේ වැටුප් වර්ධක අත්හිටුවීමෙන් පසුව නැවත වැටුප් වර්ධකය ලබා දී ඇති දිනයේ සිටය.

අදාළ ගුරු වර්ග.

1. සාමාන්‍ය උපාධිධාරීන් ලෙස පත්වීම් අනුමත කරනු ලැබූ නුපුහුණු (වෘත්තීය සුදුසුකම් නොලත්) උපාධිධාරීන්.

උපාධිධාරීන් සඳහා 37/92 රා.ප.චක්‍රලේඛයේ සඳහන් වැටුප් ක්‍රමය හා වැටුප් කාණ්ඩය: රු.37200-4X780-10X1200-1X1560-53880/=
- එස්-11-3

අදාළ කරගත යුතු නව වැටුප් ක්‍රමය හා 37/92 රා.ප.චක්‍රලේඛයේ එය අයත් වැටුප් කාණ්ඩය:-

රු.42720-12X1200-57120/= - එස්-3-7
ආරම්භක වැටුප් පියවර - රු.48720/=

2. ගෞරව උපාධිධාරීන් ලෙස පත්වීම් අනුමත කරනු ලැබූ නුපුහුණු (වෘත්තීය සුදුසුකම් නොලත් ගෞරව උපාධිධාරීන්.

ගෞරව උපාධිධාරීන් සඳහා 37/92 රා.ප.චක්‍රලේඛයේ සඳහන් වැටුප් ක්‍රමය හා වැටුප් කාණ්ඩය:
රු. 39540-1X780-10X1200-3X1560-57000/=
- එස්-11-4.

2. අදාළ කරගත යුතු නව වැටුප් ක්‍රමය හා 37/92 රා.ප.චක්‍රලේඛයේ එය අයත් වැටුප් කාණ්ඩය.

රු. 42720-12X1200-57120/= -එස්-3-7
ආරම්භක වැටුප් පියවර - රු. 51120/=

3. සහතික ලත්, නොලත් ගුරුවරුන් ලෙස පත්වීම අනුමත කරනු ලැබූ නුපුහුණු ගුරුවරුන්.

සහතික ලත් නොලත් ගුරුවරුන් සඳහා 37/92 රා.ප.චක්‍රලේඛයේ වැටුප් ක්‍රමය හා වැටුප් කාණ්ඩය:
රු.24120 - 14X660-6X780-38040/= - එස්-2-1.

අදාළ කරගත යුතු නව වඅටුප් ක්‍රමය හා 37/92 හි එය අයත් වැටුප් කාණ්ඩය.

රු.32520-10X780-2X1200-42720/= - එස්-3-3.
ආරම්භක වැටුප් පියවර: රු.32520/= (සහතික නොලත් ගුරුවරුන් සඳහා)
ආරම්භක වැටුප් පියවර : රු.36420/= (සහතික ලත් ගුරුවරුන් සඳහා)

4. පිරිවෙන් අභ්‍යාස ආයතනවල පුහුණුව ලබා ගුරුවරුන් ලෙස පත්වීම් අනුමත කරනු ලැබූ පුහුණු ගුරුවරුන් හා ගුරු විද්‍යාලයන්හි ගුරු පුහුණු සහතිකය ලබා ඇති පුහුණු ගුරුවරුන් සඳහා 37/92 රා.ප.චක්‍රලේඛයේ වැටුප් ක්‍රමය හා කාණ්ඩය.
රු.32520-10X780-6X1200-4[illegible]520 - එස්-11-1